# 2560 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2015 (2016)

**S 5**

## (05) බෞද්ධ සමාජ දර්ශනය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### II කොටස

2\. (i) ගෘහස්ථයන් විසින් පැවිදි උතුමන්ට සංග්‍රහ කළයුතු ආකාර පහක් සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ. එම ආකාර පහ නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) පැවිදි උතුමන් විසින් ගෘහස්ථයන් වෙත කෘතවේදිත්වය දක්වන ආකාර හයක් සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ. එම ආකාර හය නම් කරන්න. *(ලකුණු 07 යි)*

(iii) 'දුකින් මිදීමට මග දැක්වීමත්, ආර්ථික, සාමාජික හා ආධ්‍යාත්මික වශයෙන් සමාජය දියුණුවට යොමු කිරීමත් බෞද්ධ භික්ෂූන් වහන්සේට පැවරුණු කාර්යභාරයයි' යන ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

3\. (i) ජන සම්මතයෙන් රජෙකු පත් කර ගත් මිනිස්සු ඔහුට ත්‍රිවිධ බලයක් පැවරූ බව රාජ්‍යත්වය පිළිබඳ බෞද්ධ සංකල්පයේ සඳහන් වේ. එම ත්‍රිවිධ බලය නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) රාජ්‍යත්වයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ මතය හා බ්‍රාහ්මණ මතය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) දසරාජ ධර්මය නම් කර, ධාර්මික පාලනයක් සඳහා බුදු දහම සපයන උපදෙස් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

4\. (i) 'ධම්මෙන මාතාපිතරො භරෙය්‍ය' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) ආර්ථිකය හා බැඳුණු සතරාකාර සුවය නම් කර, එම සුවය අත්පත් කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) සාර්ථක ආර්ථික දියුණුවකට උපකාර වන උපදෙස් බුදුදහමෙහි දැක්වේ. එම උපදෙස් ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 07 යි)*

5\. (i) 'යෙ ගහට්ඨා පුඤ්ඤකරා' යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි)*

(ii) එම ගාථාවෙන් ප්‍රකට වන කරුණු නම් කර, ඒවා පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) 'විවාහය සදාචාර ධර්ම ප්‍රගුණ කිරීමට සුදුසු තෝතැන්නක් සේ සලකා බුදු දහම විවාහ ජීවිතයට උපදෙස් සපයයි.' යන ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

6\. (i) බෞද්ධ චක්‍රවර්ති රාජ්‍යයේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර නීතිය නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) බුදුරදුන් භික්ෂූන්ට නීති පැනවීමට පදනම් කර ගත් කරුණු නම් කරන්න. *(ලකුණු 07 යි)*

(iii) "ස්වේච්ඡාවෙන් සදාචාර ධර්ම පද්ධතියක් පිළිපදින බෞද්ධ සමාජයක මූලික මිනිස් අයිතිවාසිකම් තහවුරු වේ." යන්න පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

7\. (i) පාරිසරික අංගයක් වන සත්ත්වයන් කෙරෙහි ධර්මාශෝක රජු හා තුන්වන කාශ්‍යප රජු කරුණාව දැක් වූ ආකාරය පිළිබඳ සිද්ධි නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) අධර්ම රාගය, විෂම ලෝභය හා මිථ්‍යාදෘෂ්ටිය පැතිරීමෙන් පරිසරයේ සමතුලිත බව බිඳ වැටෙන ආකාරය දැක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කර, එසේ පරිසරය බිඳ වැටේන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) සතර බ්‍රහ්ම විහරණ නම් කර, එම ගුණාංග වැඩි පුද්ගලයකුගේ චර්යාව ජීව-අජීව පරිසරයේ ආරක්ෂාවට හා පෝෂණයට උපකාර වන අන්දම පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

[පස්වන පිටුව බලන්න.

Scanned by CamScanner

8. (i) 'බ්‍රාහ්මණොස්ස මුඛමාසීද්' යන ශ්ලෝකය සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි)*

(ii) වර්ණ භේදයට එරෙහි 'එසුකාරී, අස්සලායන, වංකී' යන සූත්‍රවල බුදුරදුන් දැක්වූ මූලික කරුණු නම් කරන්න. *(ලකුණු 07 යි)*

(iii) "මිනිසුන් පිළිබඳ සනාතන නොවන සම්මුති පදනම් කරගෙන විමුක්තිය හෝ ආගමික අයිතින් හෝ සාමාජීය අයිතින් හෝ අහිමි කිරීම නිසා බුදුරදුන් විසින් වර්ණ ධර්මය ප්‍රතික්ෂේප කරන ලදී." යන්න සනාථ කරන්න. *(ලකුණු 07 යි)*

9. (i) සංවර්ධනයට පදනම් වන සම්පදා හතරක් බුදුරජාණන් වහන්සේ වදාරති. එම සම්පදා හතර නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) 'ජනගහන වර්ධනය, භාණ්ඩ හා සේවා සැපයීමේ දී විවිධ ක්ෂෙත්‍රවල ගැටලු ඇති කරයි.' යන ප්‍රකාශය සැකෙවින් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) 'ජනගහන වර්ධනය සංවර්ධනයට බාධා පමුණුවන බැවින් ජනගහන වර්ධනය පාලනය කළ යුතු ය.' යනු ප්‍රචලිත අදහසකි. ඒ සම්බන්ධයෙන් බෞද්ධ ධර්ම මාර්ගයට අනුව ඉදිරිපත් කළ හැකි විසඳුම් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

***

Scanned by CamScanner